# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1779/20 – 2012 ඔක්තෝබර් 11 වැනි බ්‍රහස්පතින්දා – 2012.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය:3/3/2/75.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාසයේ, වෙනිවැල්කොල ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක කො. 9254 සහ 2012.09.07 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 සිට 7 දක්වා පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1117 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි හත (07).

1. කැබලි අංක 1
ඉඩමේ නම: හල්ගොල්ලවගුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ.ඒ. ආනන්ද සහ තවත් අය, අංක 87/බී, කහතුඩුව, පරණ පොලීසිය පාර, පොල්ගස්ඕවිට; ප්‍රමාණය: හෙක් 0.0026.

2. කැබලි අංක 2
ඉඩමේ නම: අස්වැද්දුම වගුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ.ටී. නන්දාවතී අල්විස්, අංක 14/බී, හොරතුඩුව, පොල්ගස්ඕවිට සහ කේ.ටී.එම්. අල්විස්, අංක71, පාසැල් මාවත, පොල්ගස්ඕවිට; ප්‍රමාණය: හෙක් 0.0123.

3. කැබලි අංක 3
ඉඩමේ නම: අස්වැද්දුම වගුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ගුණවතී සහ තවත් අය, අංක 181/2, කහතුඩුව, පාසැල් පාර, පොල්ගස්ඕවිට; ප්‍රමාණය: හෙක් 0.0152.

4. කැබලි අංක 4
ඉඩමේ නම: අස්වැද්දුම කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්.ඩී.ජේ. දේශප්‍රිය, අංක 261, ශාන්තිපුර, තලවතුගොඩ; ප්‍රමාණය: හෙක් 0.0204.

5. කැබලි අංක 5
ඉඩමේ නම: වෙලේගෙදර වත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. පියදාස සහ තවත් අය, අංක 24/1, වෙනිවැල්කොල, පොල්ගස්ඕවිට; ප්‍රමාණය: හෙක් 0.0127.

6. කැබලි අංක 6
ඉඩමේ නම: වෙලේගෙදර වත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී.ජේ. ප්‍රනාන්දු සහ තවත් අය, අංක 23/1, වෙනිවැල්කොල, පොල්ගස්ඕවිට; ප්‍රමාණය: හෙක් 0.0151.

7. කැබලි අංක 7
ඉඩමේ නම: අස්වැද්දුම කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ගුණවතී, අංක 23/1, වෙනිවැල්කොල, පොල්ගස්ඕවිට සහ පී. පියදාස, අංක39/13, ඉදල්ගස්වත්ත, තල්පිට, පොල්ගස්ඕවිට; ප්‍රමාණය: හෙක් 0.0334.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 දෙසැම්බර් මස 17 වැනි දින පූ.භා 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 දෙසැම්බර් 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2012 ඔක්තෝබර් මස 04 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 1094

---

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: ව/18/56/2001/1.

මා විසින් 2010 ජූනි 11 වැනි දින අංක 1657/27 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසේ පළ කරන ලද ඉඩම් රජයට අත්පත් කර ගැනීම පිළිබඳ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කරන ලදී.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුවේ, කුරුකුලාව උතුර ගමේ පිහිටි 3715 මූලික පිඹුරේ කැබලි අංක 21, කැබලි අංක 71 සහ 72 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමු.

01. **කැබලි අංක 71**

ඉඩමේ නම: බෙලිගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 30-50ක් පමණ වයසැති පොල් ගස් 20ක්, මිශ්‍ර වගාවක්, ස්ථිර ගොඩනැගිල්ලක් සහ වැසිකිලියක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. ඒ. අජන්තා ජයලත් පෙරේරා, අංක 94, කුරුකුලාව, රාගම; ප්‍රමාණය: හෙක්. 0.1611.

02. **කැබලි අංක 72**

ඉඩමේ නම: බෙලිගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 30-50ක් පමණ වයසැති පොල් ගස් 5ක්, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. ඒ. ආනන්ද ප්‍රියදර්ශන පෙරේරා, අංක 182, නුවර පාර, දළුගම, කැලණිය; ප්‍රමාණය: හෙක්. 0.0341.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 නොවැම්බර් මස 15 වැනි දින පෙ.ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 නොවැම්බර් 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චන්දිමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2012 ඔක්තෝබර් මස 08 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 1095

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.